තානාපති අතුල් කෙශප්
ස්ටාර් ගාමන්ට් විවෘත කිරීමේදී දක්වූ අදහස්
2017 ඔක්තෝබර් 20

අද දින ඔබ සියලු දෙනා හමුවීම ඉතාමත් සතුටට කරුණක්

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති වශයෙන් කටයුතු කිරීම පිළිබඳව මා ඉතා සතුටට පත්වෙනවා. එයට හේතුව මම පවසන්නම්. ඇමෙරිකන් සමාගම් මෙහි කරන්නේ මොනවාද කියා ගරු අගමැතිතුමා මගෙන් නිතරම විමසනවා. ඒ අය ශ්‍රී ලංකාවේ සාර්ථකත්වය උදෙසා කොතරම් දායකවනවාදැයි ඔබ දන්නවාද?

එම නිසා ඔහු සමග සාකච්ඡා කිරීමේදී මම ඉතා ආඩම්බරයට පත්වෙනවා. මේ රටේ වෙසෙන ඇමෙරිකන් වෙළඳ ප්‍රජාවට අයත් රට පුරා පිහිටා තිබෙන විවිධ සමාගම් වල සහ වෙනත් ව්‍යාපාර වල අවම වශයෙන් 30000 ක් 40000 ක් පමණ පිරිසක් විවිධාකාරවූ ක්ෂේත්‍රවල සේවයේ යෙදී සිටිනවා. මෙම සමාගම් සහ එම සේවකයින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සහ ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතිකයට සැහෙන දායකත්වයක් ලබාදෙනවා. මේ අය ශ්‍රී ලාංකිකයින්ගේ සෞභාග්‍යයට පමණක් නොව ඇමෙරිකන් ජනතාවගේ සෞභාග්‍යයටත් දායකවෙනවා.

මෙහි තිබෙන ඇමෙරිකන් සමාගම් ඉතා උසස් තාක්ෂණය උපයෝගී කරගන්නා වැඩකටයුතුවල නිරතවෙනවා. අගමැතිතුමා පැවසූ ලෙසම ලංකාවේ ශ්‍රම බලකාය විශේෂයි. එසේම පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සිදුවෙමින් තිබෙන දේ ඇත්ත වශයෙන්ම සුවිශේෂයි.

මිත්‍රවරුනි, ටිලර්සන් ලේකම් තුමා ඊයේ වොෂින්ටන්හිදී සිදුකළ කථාවකදී ඇමෙරිකාව ඉන්දීය සාගර කළාපයට, වඩාත් පුලුල් ලෙස ගතහොත් ඉන්දු පැසිෆික් කළාපයට ප්‍රවේශ වන ආකාරය පිළිබඳව අදහස් දැක්වූවා. ඇමෙරිකාව ඉන්දු පැසිෆික් කළාපයේ බලවතා වශයෙන් දිගු කාලයක් පුරා කටයුතු කරන බව ටිලර්සන් ලේකම් තුමා සඳහන් කළා එයින් අදහස් වන්නේ අප මෙම කළාපය අත්පත් කරගැනීමට උත්සාහ කරන බව නොවේ. මෙයින් අදහස් වන්නේ මෙම කළාපයේ ගැටලුවලට අපි සියලුදෙනා ජයග්‍රහණය කරන ආකාරයේ විසඳුම් ලබාදීම කෙරෙහි විශ්වාසය තබා ඇති බවයි. ඇමෙරිකානු ජාතිකයින් සමස්ථ ලෝකයාගේ සුභසාධනය වෙනුවෙන් නීති සහ සාරධර්ම තුලින් ක්‍රියාත්මක වන්නාවූ ජගත් මෙහෙයුම් පද්ධතියක් සැකසීම සඳහා මහත් ප්‍රයත්නයන් දරා තිබෙනවා. මෙම උත්සාහය එක්සත් ජනපදයේ සාමය සහ ආරක්ෂාව සඳහා පමණක් නොව සමස්ථ ලොකයේ සෞභාග්‍ය සහ යහපැවැත්ම උදෙසාය.

මිත්‍රවරුනි, ඇමෙරිකන් සමාගම් උසස්ම තත්වයේ ආචාර ධර්ම, සැලසුම්, නවෝත්පාදනයන්, තාක්ෂණය සහ වගකීමෙන් යුත් කළමනාකරණ විධික්‍රම මෙහි රැගෙන එන අතර පරිසරය සුරකීමේ වගකීමට ඉහළම ප්‍රමුඛත්වය ලබාදෙනවා. අද දින මෙම ගොඩනැගිල්ලේ රැඳී සිටීමට හැකිවීම පිළිබඳව මා ඉතා සතුටට පත්වෙනවා. මෙය ලෝකයේ පරිසර සුරක්ෂිතභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අනුගමනය කරමින් නිර්මාණය කරන ලද ගොඩනැගිලි කිහිපයකින් එකක්. කොමාර් වැනි ඇමෙරිකන් සමාගම් පාර්ශවකරුවන් ලෙසින් ශ්‍රී ලංකාව වැනි රටවල් වල ආයෝජනය කරනවිට ඔවුන් විසින් දරන නායකත්වය මනාව පෙන්නුම් කිරීමක් ලෙස මෙය හැඳින්විය හැකියි.

ගරු අගමැති තුමනි, අප ඔබගේ සහ ජනාධිපතිතුමාගේ දැක්ම තුළින් සහ මේ රටට දිනාගැනීමට අපේක්ෂා කරන තත්වය පිළිබඳව මහත් විශ්වාසයක් තබා තිබෙනවා. ඔබගේ ඡන්දදායකයින් ප්‍රජාතන්ත්‍රවාදය, සාමකාමී, සෞභාග්‍යමත් සතුටින් පිරි ශ්‍රී ලංකාවක් අපේක්ෂා කිරීම පිළිබඳව අපි විශ්වාසය තබනවා. උසස් තත්වයේ රැකියාවන් සහ සියලු ජනතාවට සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්, සමස්ථ ඉන්දු පැසිෆික් කළාපයේ කේන්ද්‍රය බඳු ශ්‍රී ලංකාවක් බිහිවීම කෙරෙහි අපි විශ්වාසය තබනවා.

එක්සත් ජනපද තානාපති කාර්යාලය වෙළඳාම සඳහා පහසුකම් සැළසීම පිළිබඳ පුහුණු වැඩසටහන් මගින් සෞභාග්‍ය උදාකරලීමට ප්‍රයත්න දරනවා. සංවර්ධන පාර්ශවකරණය සම්බන්ධයෙන් අප අතර පවත්නා වසර 60 ක සම්බන්ධතාවය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විනිවිදභාවය සහ නීතියේ ආධිපත්‍යය වැඩිදියුණු කිරීමට සහ නාවික කටයුතු වර්ධනය සහ පුහුණු කටයුතු සඳහා වටිනා උපදෙස් සහ නව දැනුම ලබාදෙනවා.

මිලෙනියම් චැලේන්ජ් සමාගම ශ්‍රී ලංකාවට පැමිණීමටත් ජනතාව සමග වැඩකිරීමටත් උනන්දුවක් දක්වා තිබෙනවා. ත්‍රස්ත්‍රවාදයට එරෙහිව සටන් කිරීමට සහ නීතිය ක්‍රියාවට නැංවීම සඳහා අපගේ යුධ හමුදාවන් අතර ශක්තිමත් හා උද්යෝගීමත් සම්බන්ධතාවක් පවතිනවා. කොමාර් සහ ස්ටාර් සමාගම් සිදුකරන කාර්යයන් පිළිබඳව අපි දැඩි විශ්වාසයක් තබා තිබෙනවා. අපි එකට එක්වී විශාල කාර්යයභාරයක් ඉටු කරනවා. මෙහි සිටින සේවකයන් පිළිබඳව අපි අපගේ විශ්වාසය තබා තිබෙනවා. ශ්‍රී ලංකාවේ රජයත් ජනතාවත් ලඟාකර ගැනීමට අපේක්ෂා කරන කරුණු පිළිබඳව අපි විශ්වාසය තබා තිබෙනවා.

අද ඉතා ප්‍රීතිමත් දිනයක්. අද මම ඉතා සතුටට පත්වනවා.

මම පැමිණියේ නිව් ජර්සි ප්‍රාන්තයෙන් නොවේ. මගේ ගම වර්ජිනියා ප්‍රදේශයයි. මම තරමක් දුරට වෙරළාසන්න ප්‍රදේශයේ තැනැත්තෙක්. ඇමෙරිකන් සමාගමක් මෙවැනි වගකීම් සහිත නායකත්වයක් සහ මෙතරම් මිතුරු සහ දිගුකාලීන පාර්ශවකරණයකින් යුතුව ස්ටාර් වැනි නමක් දිනාගත් ගෞරවනීය ශ්‍රී ලාංකීය සමාගමක් සමග පාර්ශවකරණයෙන් කටයුතු කිරීම ඉතා සතුටට කරුණක්.

ගරු අගමැතිතුමනි ඔබ මෙහි පැමිණීම මා ඉතා අගය කරනවා.

ඇමෙරිකන් තානාපති කාර්යාලයේ නෝනාවරුනි මහත්වරුනි, අද දිනය සාර්ථක කරගැනීම සඳහා ඔබ විසින් සිදුකරන ලද මහත් කැපවීම හා දායකත්වය වෙනුවෙන් මාගේ අවංක ස්තූතිය පුදකරනවා

ඔබ සැමට ස්තූතියි.